කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 01/2015

මගේ අංක : DMS/Circular/2015
කළමනාකරණ සේවා
දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01
2015.09. 21

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් ප්‍රධානීන්

2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවයේ නියුතු කොන්ත්‍රාත් නිලධරයන් සඳහා අන්තර් දීමනා ගෙවීම

"2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය අංශයේ නිලධරයන්ගේ හා විශ්‍රාමිකයන්ගේ දීමනා සංශෝධනය කිරීම" මැයෙන් යුතුව නිකුත් කර ඇති 2015.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2015 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඉහත සඳහන් චක්‍රලේඛ විධිවිධාන 2006.09.22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30, 2009.06.01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30(I) යන චක්‍රලේඛයන්ට අනුව වැටුප් ක්‍රම අනුමත කර ඇති සහ එම වැටුප් ක්‍රම අදාල කරගෙන වැටුප් ගෙවනු ලබන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන් සඳහා අදාල කර ගත යුතුය.

03. ඒ අනුව, එම ආයතනයන්හි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති තනතුරුවල 2015 ජනවාරි මස 01 දින වන විට කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටි නිලධාරීන්හට ඔවුන්ගේ කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් මාසික දීමනාව රු.10,000/-ක අගයකින් වැඩි වන පරිදි සංශෝධනය කර 2015 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවීම් කළ යුතුය.

04. මෙම චක්‍රලේඛයෙන් පරිබාහිරව කිසියම් තැනැත්තෙකුට මොනයම් හෝ වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම් ඒ පිළිබඳව අදාළ ආයතනයේ මූල්‍ය කළමනාකරු/ගණකාධිකාරී පෞද්ගලිකව වගකිව යුතු අතර ගෙවා ඇති මුදල ආපසු ගෙවීමට එම තැනැත්තා බැඳී සිටී. එවැනි සාවද්‍ය වැටුප් පරිවර්තනයන් හෝ ගෙවීම් සිදු කරන වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව පියවර ගැනීමට අදාළ බලධාරීන් ක්‍රියා කළ යුතු වේ.

ආර්.එච්.එස්.සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
04. විගණකාධිපති
05. ලේකම්,ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව